දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකය - රුහුණ විශ්වවිද්‍යාලය
Distance and Continuing Education Unit – University of Ruhuna

ශාස්ත්‍රවේදී සාමාන්‍ය (බාහිර) උපාධි ප්‍රථම භාග 2014 පුනර් පරීක්ෂණය - 2018 ජුනි/ජූලි
Bachelor of Arts General (External) Degree Part I Repeat Examination 2014 – June/July 2018

ඉසා 2.1 - ශ්‍රී ලංකා ඉතිහාසය (ක්‍රි.ව. 1500 සිට ක්‍රි.ව. 1796 දක්වා)
HYG 2.1 - History of Sri Lanka (From 1500 AD. to 1796 AD.)

කාලය පැය තුන යි

ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න
පැහැදිලි අත් අකුරින් පිළිතුරු සපයන්න

---

01. "16 C ආරම්භයේ කෝට්ටේ රාජධානයේ පැවති දේශපාලන පසුබිම පෘතුගීසි බල ව්‍යාප්තියට සුදුසු තෝතැන්නක් විය." විමසන්න.

02. <u>එක්කෝ</u>
ක්‍රි.ව. 1594 සිට ක්‍රි.ව. 1638 දක්වා පෘතුගීසීන් උඩරට රාජ්‍යයට එල්ල කළ ආක්‍රමණ විස්තර කර, උඩරට රාජ්‍යයට සිය ස්වාධීනත්වය අරක්ෂා කර ගැනීමට උපකාරී වූ සාධක සාකච්ඡා කරන්න.

<u>නැතහොත්</u>
පෘතුගීසීන් හා යාපන රාජධානියේ පාලකයන් අතර පැවති සම්බන්ධතාවල ස්වරූපය පැහැදිලි කරන්න.

03. "16 C මෙරට සිටි උපායශීලී දේශපාලන නායකත්වය" මායාදුන්නේගේ ක්‍රියා කලාපය පිරික්සීමේ දී ඉහත ප්‍රකාශය කෙතෙක් උචිත දැයි පරීක්ෂා කරන්න.

04. මහනුවර රාජධානියේ පැවති අධිකරණ ක්‍රමය පිළිබඳ ඓතිහාසික රචනයක් ලියන්න.

05. ක්‍රි.ව. 1638 දී ලන්දේසීන් හා උඩරට රජු අතර ඇති වූ ගිවිසුම කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින් උඩරට රාජධානිය කෙරෙහි එය බලපෑ අන්දම සමාලෝචනය කරන්න.

06. ක්‍රි.ව. 1766 උඩරට - ලන්දේසි ගිවිසුම උඩරට රාජධානිය කෙරෙහි ඇති කළ බලපෑම ප්‍රමාණ කරන්න.

07. ශ්‍රී ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශවල පෘතුගීසීන් හා ලන්දේසීන් අනුගමනය කළ ආගමික හා ආර්ථික ප්‍රතිපත්ති පරීක්ෂා කරන්න.

08. "18 C මැද වන විට මුහුදු බඩ පළාත්වල ඇතිවූ බෞද්ධ ආගමික පුනරුදයේ නිර්මාතෘවරුන් වූයේ ගණින් වහන්සේලා ය" ඔබ ඉහත ප්‍රකාශයට එකඟ වන්නේ ද නැද්ද යන්න සහේතුකව පැහැදිලි කරන්න.

****************************************